**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

2010 - අවසාන වාර ඇගයීම

11 ශ්‍රේණිය

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 1**

නම/විභාග අංකය .................................................................................. කාලය පැය 01යි


ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න

1. තොරතුරක වටිනාකම රදාපවතිනුයේ
   a) අර්ථවත් හා කාලීන බව මත
   b) සහසම්බන්ධතාවය හා සම්පූර්ණ බව මත
   c) විස්වාසනීයත්වය හා සන්නිවේදන හැකියාව මත
   ඉහත ඒවායින් සත්‍ය වනුයේ,
   1) a හා b 2) a හා c 3) b හා c 4) a, b හා c යන සියල්ලම

2. පරිගණකයක මධ්‍ය සැකසුම් ඒකකයට අයත් කොටස් වන්නේ
   1) ගණිත හා තර්ක ඒකකය (ALU), පාලන ඒකකය (Control Unit), වාරක මතකය (Cache memory )
   2) ගණිත හා තර්ක ඒකකය (ALU), පාලන ඒකකය (Control Unit), සසම්භාවී ප්‍රවේශ මතකය (RAM )
   3) ප්‍රධාන මතකය (Main memory), වාරක මතකය (Cache memory ), පාලන ඒකකය (Control Unit)
   4) පාලන ඒකකය (Control Unit), පඨන මාත්‍ර මතකය (ROM), සසම්භාවී ප්‍රවේශ මතකය (RAM )

3. පරිගණක පරිණාමයේ දී වර්ධනය වූ ලක්ෂණය කුමක්ද?
   1) ප්‍රමාණය (The size)
   2) විදුලි පරිභෝජනය (Power consumption)
   3) සැකසුම් වේගය (The speed of processing)
   4) තාපය උත්පාදනය (Heat generation)

4. රූප සටහනින් දැක්වෙන පරිගණක ජාල ස්ථල (Network Topology) වනුයේ
   1) තාරකා ස්ථලය (Star topology)
   2) බස් ස්ථලය (Bus topology)
   3) රුක් ස්ථලය (Tree topology)
   4) දැල් ස්ථලය (Mesh topology)



5. යම් කිසි රටක IP ලිපිනය (IP address) සකසා ගැනීමේදී භාවිතා කිරීමට වඩාත් ඉඩ ඇති domain නාමය කුමක්ද?
   1) mal.act.fin.edu
   2) nasa.gov
   3) nano.ac.in
   4) support.sony.com

6. ප්‍රකාශ තන්තුවක දත්ත සම්ප්‍රේශණය හා සම්බන්ධ ලක්ෂණ අතරින් නිවැරදි වන්නේ .
   a) ආලෝකයේ ප්‍රවේගය (Velocity of light)
   b) විභව අන්තරය (Voltage)
   c) පූර්ණ අභ්‍යන්තර පරාවර්ථනය (Full internal reflection)
   1) a සහ b පමණි 2) b සහ c පමණි
   3) a, සහ c පමණි 4) c සහ d පමණි

7. පහත දැක්වෙන මෙහෙයුම් පද්ධති අතරින් චිත්‍රක අතුරු මුහුණතක් (Graphical User Interface) නොපෙන්වනු ලබන මෙහෙයුම් පද්ධතියක් වන්නේ

1) Windows Xp        3) Ubuntu

2) Windows Vista        4) DOS

**8.** අන්තර්ජාලය සම්බන්ධව පහත ප්‍රකාශ සලකා බලන්න

a) Protocols නම් නීති රීති පද්ධතියක් මගින් අන්තර්ජාල සම්ප්‍රේශණ මෙහෙයවනු ලබයි.

b) අන්තර්ජාලය විවිධ සේවාවන් කිහිපයකින් සමන්විත වෙයි.

c) ලෝක විසිරි වියමන (World Wide Web) යනු අන්තර්ජාලයට තවත් නමකි.

d) සෑම වෙබ් අඩවියකටම URL නමින් හැඳින්වෙන අනන්‍ය ලිපිනයක් ඇත.

මේ ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ

1) a,b සහ **c** පමණි        2) a,b සහ d පමණි        3) a,c සහ d පමණි        4)b,c සහ d පමණි

9. පද්ධති වර්ගීකරණය සඳහා භාවිත කරන ක්‍රමවේදයක් නොවන්නේ

1)හස්තීය (Manual) හා ස්වයංක්‍රීය (Automated)

2) මාර්ගගත (Online) කාණ්ඩ සැකසුම් (Batch Processing)

3)අංකිත(Digital) හා ප්‍රතිසම(Analog)

4) විවෘත(Open) සහ සංවෘත (Close)

10. පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන්නේ

1)මොඩමය (Modem)

2) අන්තර්ජාල සැපයුම් කරු (Internet Service Provider)

3) ජාල අතුරුමුහුණත් පත (Network Interface Card)

4) ඉහත සියල්ල

11. එක්තරා සංඛ්‍යා පද්ධතියක් සඳහා භාවිත වන සංඛ්‍යාංක (Digits) ගණන 7 කි මෙම සංඛ්‍යා පද්ධතියේ පාදය වනුයේ

1) 6        2) 7        3) 8        4)16

12. පහත සංඛ්‍යා පද්ධති වලින් දැක්වෙන අගයයන් සලකා බලන්න.

a). $10_2$        b). $10_8$        c). $10_{10}$        d). $10_{16}$

ඒ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ

1) සියලුම සංඛ්‍යා අගයෙන් සමානය.

2) සියලුම සංඛ්‍යා දශමය සංඛ්‍යා පද්ධතියේ 10 අගයට සමානය

3) සියලුම සංඛ්‍යා විසින් තමා අයිති සංඛ්‍යා පද්ධතියේ පාදයේ අගය නිරූපනය කරයි

4) සියලුම සංඛ්‍යා ද්විමය සංඛ්‍යා පද්ධතියේ දෙක අගය නිරූපනය කරයි.

13. දක්වා ඇති සත්‍යතා වගුව අනුව R ට සමාන ප්‍රකාශය වනුයේ

| A | B | C | R |
|---|---|---|---|
| 0 | 0 | 0 | 1 |
| 0 | 0 | 1 | 0 |
| 0 | 1 | 0 | 0 |
| 0 | 1 | 1 | 0 |
| 1 | 0 | 0 | 0 |
| 1 | 0 | 1 | 0 |
| 1 | 1 | 0 | 0 |
| 1 | 1 | 1 | 0 |

1) $A.B.C$ 2. $\overline{A.B.C}$ 3. $\overline{A+B+C}$ 4. $A+B+C$

14. $10110_2 + 110_2$ හි අගය වන්නේ

1)11100 2)10001 3)10110 4)10000

15. හීටරයකින් වතුර රත්කිරීමේ දී, **විදුලිය සම්බන්ධ කර ඇති විට වතුර නියමිත ප්‍රමාණයට වඩා අඩු වුවහොත්** විදුලිය විසන්ධි කල හැකි උපාංගයක් නිර්මාණය කිරීමට සිසුවෙක් අදහස් කරයි. මෙහිදී භාවිත කළ යුතු තර්කය වන්නේ

1) OR තර්කය 2) AND තර්කය 3) NOT තර්කය 4) NAND තර්කය


16. පරිගණක අපරාධකරුවන් යටතට ගැනෙන කණ්ඩායමක් වනුයේ

1) trackers ය 2) browsers ය 3) suffers ය 4) hackers ය

17. A.(A+B) යන තාර්කික ප්‍රකාශය තුල්‍ය වනුයේ

1) B 2) $\bar{B}$ 3) A+B 3) A

18. පහත තර්ක පරිපථයේ F සඳහා ප්‍රකාශනය වන්නේ




1) $AB + \bar{A}$B 2) $AB + \bar{A}\bar{B}$ 3) $AB + \overline{AB}$ 4) $(A + B).(\bar{A} + \bar{B})$

19. විවෘත ප්‍රභව කේත (Open Source) මෙහෙයුම් පද්ධතියක් (Operating System) වන්නේ

1) DOS 2) Windows Vista 3) Ubuntu 4) Macintosh

20. වදන් සැකසුම් (Word processing) ලියවිල්ලක ස්ථාන බොහෝ ගණනක දී sun වෙනුවට son ලෙස වැරදියට ලියවී (Type) ඇත. මෙය වඩාත් පහසුවෙන් නිවැරදි කල හැක්කේ

1) මකා නැවත ලිවීමෙනි. (Delete and Retype)

2) Auto Correct මගිනි

3) Find and Replace මගිනි

4) Spellings and grammar මගිනි

21. වදන් සැකසුම් (Word processing) ලියවිල්ලක් සම්බන්ධව පහත ප්‍රකාශ වලින් **අසත්‍ය** ප්‍රකාශ වන්නේ.

a) එක් වරක් Copy කල දෙයක් කිහිප වරක් Paste කල හැක

b) Delete කල දෙයක් නැවත ආපසු ලබා ගත නොහැක

c) Cut Paste මගින් එක් තැනක තිබූ වචනයක් වෙනත් තැනකට ගෙනයා හැක

1) a සහ b පමණි
3) a සහ c පමණි
2) b, සහ c පමණි
4) a, b සහ c තුනම

22. පැතුරුම්පත් (Spread sheet) මෘදුකාංගයේ ගොනුවක (File) නමෙහි දිගුව ලෙස සැලකිය හැක්කේ

1) .xls
3) .slx
2) .doc
4) .xsl

- පහත දැක්වෙන වැඩපත භාවිතා කර අංක 23 හා 25 ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | භාණ්ඩය | ඒකක ගණන | ඒකක මිළ | මුළු වටිනාකම | වට්ටම | ශුද්ධ වටිනාකම | |
| 2 | Monitor | 3 | 3500 | | | | |
| 3 | Digital camera | 4 | 16500 | | | | |
| 4 | UPS | 2 | 4500 | | | | |
| 5 | Mother board | 2 | 10500 | | | | |
| 6 | Flash Drive | 8 | 4900 | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |

23 D2 කෝෂයට ඇතුළත් කළ යුතු සමීකරණය වන්නේ

1) B2*C2 2) =B2,C2
3) =B2:C2
4) +B2*C2

24 භාණ්ඩ සඳහා මුලු වටිනාකමෙන් 5%ක වට්ටමක් ලබා දෙන්නේ නම් අදාල පිළිතුර ලබා ගැනීමට E2 කෝෂයේ ලිවිය යුතු සමීකරණය වන්නේ

1) =D2/100*5*B2
3) =D2*5%*B2
2) =D2/100*5
4) D2*5%*3

25 ශුද්ධ වට්නාකම් වල එකතුව ලබා ගැනීමට F7 හි ලිවිය යුතු සමීකරණය වන්නේ

1) =SUM(F2:F6) 3) =F2..F6
2) = TOTAL(F2:F6) 4) =COUNT(F2..F6)

26 ◌දයුත් ප්‍රදර්ශක මෘදුකාංගය භාවිතයෙන් ඉදිරිපත් කිරීමක් කරන විට ඇති වන වාසියක් නොවන්නේ

1) වඩා ප්‍රබල සන්නිවේදනයකට මග පෑදීමය.
2) නිර්මාණය සකස් කිරීමට ගත වන කාලය දිගු වීම
3) අඩු ශ්‍රමයකින් වැඩි කාර්යභාරයකට ඉඩ සැලසීම
4) ප්රදර්ශකය හා ප්රේක්ෂකයා අතර සම්බන්ධතාවය ඉහළ නංවයි.

27 දත්ත සමුදාය කළමනාකරණ පද්ධති මෘදුකාංගයක් නොවන්නේ

1) Oracal 3) Access
2) Foxpro 4) Firefox

28 දත්ත සමුදාය කළමනාකරණයේදී වගු (table) දෙකක් අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා එම වගු අතර තිබිය යුතු අවමඅවශ්‍යතාවය වන්නේ

1) වගු දෙකෙහි ප්‍රධාන ක්ෂේත්‍ර (Key fields) අනිවාර්යයෙන්ම සමාන විය යුතුය.
2) වගු දෙකෙහි එක් ක්ෂේත්‍රයක් හෝ අනිවාර්යයෙන්ම සමාන විය යුතුය
3) වගු දෙකෙහි සියළු ක්ෂේත්‍රයන් අනිවාර්යයෙන්ම සමාන විය යුතුය
4) වගු දෙකෙහි තිබිය යුතු ක්ෂේත්‍ර ගණන සමාන විය යුතුය

29 විෂුවල් බේසික් (Visual Basic) භාවිතයෙන් ක්‍රමලේඛණය කරනලද කේතයක්

1) එය කේතනය කල පරිගණකයේ දෘඩාංග මත රදා පවතී (Machine Dependent)
2) ක්‍රියාත්මක (Run) කිරීමට පෙර යාන්ත්‍ර භාෂාවට (Machine code) පරිවර්ථනය කල යුතුය
3) ක්‍රියාත්මක වීමේ වේගය ඉතා ඉහලය
4) සංස්කරණය කළහැක්කේ දෘඩාංග පිළිබඳ මනා දැනුමක් තිබෙන ක්‍රමලේඛකයෙකුට පමණි

30 8 - 2 * 5 MOD 3 + 5 යන ප්‍රකාශනය සුලු කල විට අගය


1) 2 2) 12 3) 5 4) 6

31 පහත ව්‍යාජකේතයේ ප්‍රතිදානය සොයන්න?.

```
begin
x = 0
num = 100
Until x >= num
   x = x + 10
   num = num - x
   Print num
repeat
End
```

1) 90, 80,70,60 2) 0, 10, 40, 70 3) 90, 70, 40, 0 4) 0, 10, 20, 30

32 පහත ගැලීම් සටහනේ ප්‍රතිදානය සොයන්න.




1) -2 2) 2 3) -8 4) 8

33 m, n යනු නිඛිල විචල්‍යය නම්, පහත සඳහන් ක්‍රමලේඛය

```
n = 8
m = 4
Do while m > 3
        n = n - 1
Loop
```

1) වාර 3 ක් පුනර්කරණය (Repeat) වේ.
2) වාර 2 ක් පුනර්කරණය (Repeat) වේ.
3) කිසි විට අවසන් නොවේ.
4) කිසි විට ආරම්භ නොවේ.

34 සාමාන්‍ය ජංගම දුරකථනයක් පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ

a). එහි ආදාන හා ප්‍රතිදාන උපාංග ඇත.

b). එහි ප්‍රධාන මතකයක් ඇත.

c). එහි මෙහෙයුම් පද්ධතියක් ඇත.

මින් සත්‍ය වන්නේ

1) a හා b පමණි
2) a හා c පමණි
3) b හා c පමණි
4) a,b හා c තුනම

35 විද්‍යුත් වානිජ්‍ය මගින් අත්වන ප්‍රතිලාභ කිහිපයක් නම්

a) පිරිවැය අඩුවීම

b) පාරිභෝගිකයින්ගේ කාලය හා ශ්‍රමය අඩුවෙන් වැය වීම

c) තරගකාරිත්වය නිසා ගුණාත්මක බවෙන් යුතු භාණ්ඩ වෙළඳපොලට පැමිණීම.

මින් සත්‍යවන්නේ,

1) a හා b 2) a හා c 3) b හා c 4) a,b හා c තුනම

36 පරිගණකයක් දීර්ග කාලයක් භාවිතා කිරීමෙන් වැළඳෙන රෝග වන්නේ

a. ඇස් රුදාව හා හිසරදය (Eye strain & Headache)
b. කොන්දේ හා බෙල්ලේ අමාරුව
c. උණ සහ සෙම්ප්‍රතිශ්‍යාව
d. Repetitive Strain injury

මින් සත්‍යවන්නේ,

1) a හා b  2) a, c හා d  3) a, b හා c  4) a,b හා d

37 HTMLලේඛනයක ව්‍යුහය අනුව Title Tagඑක ඇත්තේ

1) <BODY> හා </BODY> අතරය
2) <HEAD> හා </HEAD> අතරය
3) <DIV> හා </DIV> අතරය
4) <TABLE> හා </TABLE> අතරය

38 HTMLලේඛනයක අළුත් පේලියක් ආරම්භ කිරීම සඳහා භාවිතා වන Tag එක වනුයේ

1) <new>  2) <col>  3) <br>  4) <ul>

39 චලන රූපයක් නිර්මාණය කරගැනීම සඳහා වඩාත් සුදුසු මෘදුකාංගයක් වනුයේ 1)
1) Macromedia Flash
2) Adobe Photoshop
3) MS Powerpoint
4) Safari

40 තොරතුරු තාක්ෂණය නිසා ඇතිවිය හැකි සාමාජීය ගැටලුවක් නොවන්නේ
1) ලිපි ද්‍රව්‍ය භාවිතය අඩුවීම.
2) Digital Divide ඇතිවීම
3) පුද්ගලයින් මානසික ආතතීන්ට ලක්වීම.
4) අන්තර් පුද්ගල සම්බන්ධතා අඩුවීම

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2010 - අවසාන වාර ඇගයීම

11 ශ්‍රේණිය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය 11

නම/විභාග අංකය .............................................................................. කාලය පැය 02යි

**පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න**

පළමු ප්‍රශ්ණය සඳහා ලකුණු 20 ක්ද ඉතිරි ප්‍රශ්ණ සඳහා ලකුණු 10 බැගින් ද ලැබේ

**1 කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න**

I. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය ශ්‍රීලංකාවේ කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා භාවිතා වන අවස්ථා දෙකක් නම් කරන්න .

II. පරිගණක භාවිතායේදී වැරදි ඉරියව් වල පිහිටීම නිසා ඇතිවිය හැකි ආබාධ දෙකක් නම් කරන්න .

III. අංකිත(Analog) සහ ප්‍රතිසම(Digital) සංඥා අතර වෙනසකුමක්ද ?

IV. පරිගණක ජාලකරණයේ වාසි දෙකක් නම් කරන්න .

V. බූලියාණු වීජ ගණිතයට අනුව A=1 B=1 වූවිට A+B යන්නෙහි ප්‍රතිඵලය කුමක්ද?.

VI. පරිගණක සම්පාදක(Compiler) යනු කුමක්ද?.

VII. බහු මාධ්‍ය (Multi Media) සන්නිවේදනයේදී භාවිතා වන මාධ්‍ය දෙකක් නම් කරන්න .

VIII. අන්තර්ජාලයෙහි ඇති ඉගෙනුම් කලමණාකරණ පද්ධතියක්(Learning Management System) මගින් ඔබට ලබා ගත හැකි ප්‍රති ලාභ දෙකක් නම් කරන්න .

IX. බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය මගින් ඩෙංගු මර්ධන ව්‍යාපාරයක් දියත් කරයි.මේ සඳහා අත් පත්‍රිකාවක් පිළියෙළ කිරීමට සුදුසු මෘදුකාංගයක් නම් කරන්න .

X. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්ථමේන්තුව , මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමේදී හස්තීය (Manual) ක්‍රම යොදා ගැනීමට වඩා පරිගණකය භාවිතා කිරීමේ වාසි දෙකක් ලියන්න.

2 කුමුදු පහළගම බාලිකා විදුහලේ 8 ශ්‍රේණියේ සිටින කීකරුම ශිෂ්‍යයාව යයි ඇගේ පන්ති භාර ගුරුතුමිය පවසයි.ඇය පාසලේ අවසාන පරීක්ෂණයේදී සිංහල විෂය සඳහා ,ලකුණු 95 ක් ලබා ගෙන වැඩිම ලකුණු ලබා ගත් සිසුවිය වූවාය.දිගු කෙස් කළඹක් හිමි ඇය උසින් මීටර 1.25 ක් පමණවේ.

a. ඉහත සිද්ධිය තුළ අන්තර්ගත
    i. ගුණාත්මක දත්ත දෙකක් නම් කරන්න .
    ii. ප්‍රමාණාත්මක දත්ත දෙකක් නම් කරන්න .
b. 8 ශ්‍රේණියේ සිසුවියන්ගේ ශිෂ්‍ය වාර්තා ගොනු පන්ති භාර ගුරුතුමිය විසින් පවත්වා ගෙන යනු ලබයි.
    i. එම දත්ත සමුදාය පවත්වා ගැනීමට භාවිතා කළ හැකි වඩාත් උචිත මෘදුකාංගය කුමක්ද?
    ii. දත්ත සමුදාය වගුවක ප්‍රාථමික යතුර අර්ථ දක්වන්න.
    iii. ඒ ඇසුරින් 8 ශ්‍රේණියේ සිසුවියන් පිළිබඳ දත්ත පාදකයක්(Data Base) ගොඩනැගීම සඳහා භාවිතා කළ හැකි වඩාත් උචිත ක්ෂේත්‍ර(Field) හතරක් නම් කරන්න .
    iv. ඉහත ක්ෂේත්‍ර සඳහා යොදා ගන්නා දත්ත වර්ග(Data types) නම් කරන්න .
    v. සිසුවියන් පිළිබඳ කෙටි වාර්තාවක් ඉහත දත්ත පාදක වගුවට ඇතුළත් කිරීම සඳහා යොදා ගත හැකි දත්ත වර්ගය නම් කරන්න .
    vi. පාසල පිහිටි නගරබල ප්‍රදේශය තුළ පදිංචි සිසුවියන් තෝරා ගන්නා ආකාරය දත්ත සමුදාය ගොනු ඇසුරින් දක්වන්න.

3 ඕලුගම මහා විදුහලේආපන ශාලාවේ අලෙවි කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික පැතුරුම්පත් භාවිතා කෙරේ. මෙම ආපන ශාලාවන් තොග වශයෙන් මිලට ගන්නා කෑම සහ බීම සඳහා වට්ටමක් දෙනු ලැබේ.පහත දක්වා ඇත්තේ පාසලේ ක්‍රීඩා උත්සවයේ කිරි පැකට් අලෙවිය සඳහා යොදාගත් වැඩපතක කොටසකි .කිරි පැකට් 100 ක් හෝ ඊට වැඩිපුර මිළට ගන්නා විට 5% ක වට්ටමක්දෙනු ලැබේ. කිරි පැකට් එකක මිළC2 කෝෂයේද වට්ටමC3 කෝෂයේද
සඳහන්වේ.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | **ඕලු ආපන ශාලාව** | | | | |
| 2 | **කිරි පැකට් එකක මිළ** | | **Rs20.00** | | |
| 3 | **වට්ටම** | | **5%** | | |
| 4 | **මිලට ගත් අය** | **මිලට ගත් කිරි පැකට් ගණන** | **අයවිය යුතු මුදල** | **වට්ටම** | **ගෙවූ මුදල** |
| 5 | පැරකුම් නිවාසය | 100 | Rs2,000.00 | Rs100.00 | Rs1,900.00 |
| 6 | මහින්ද නිවාසය | 225 | Rs4,500.00 | Rs225.00 | Rs4,275.00 |
| 7 | තිස්සනිවාසය | 500 | Rs10,000.00 | Rs500.00 | Rs9,500.00 |
| 8 | විජය නිවාසය | 750 | Rs15,000.00 | Rs750.00 | Rs14,250.00 |
| 9 | ගැමුණු නිවාසය | 75 | Rs1,500.00 | Rs0.00 | Rs1,500.00 |
| 10 | | | | **ගෙවූ මුලුමුදල** | Rs31,425.00 |

I. මිළට ගත් කිරි පැකට් සඳහා අයවිය යුතු මුදල ගනණය කිරීම සඳහා **C5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **C6:C9** පරාසයට පිටපත් කළ විට C තීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

II. කෝෂ ලිපින පමණක් භාවිතා කර වට්ටම ගනණය කිරීම සඳහා **D5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **D6:D9** පරාසයට පිටපත් කළ විට Dතීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

III. කෝෂ ලිපින පමණක් භාවිතා කර ගෙවූ මුදල ගනණය කිරීම සඳහා **E5** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය සඳහන් කරන්න. (මෙම සූත්‍රය **E6:E9** පරාසයට පිටපත් කළ විට Eතීරුවේ සඳහන් ඊට අදාළ අගයයන් ලැබිය යුතුය.)

IV. **E10** කෝෂයට ගෙවූ මුළු මුදල ගනණය කිරීම සඳහා භාවිත කල හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

4 කමල් සුළු වෙළෙඳ ව්‍යාපාරිකයෙක් මෙන්ම පරිගණක විශේෂඥයෙකි. ඔහු භාණ්ඩ මිළදී ගැනීම, විකිණීම, ගබඩා කිරීම, මුදල් ගනුදෙනු කිරීම, යන කාර්ය ඉටුකරමින් ඔහුගේ වෙළෙඳ ව්‍යාපාරය පවත්වාගෙන යයි. බැංකු කටයුතු මෙන්ම වෙළෙඳ කටයුතු ද කාර්යක්ෂම කිරීම සඳහා පරිගණක ගත ස්වයංක්‍රීය පද්ධතියක් (Automated System) ස්ථාපනය කිරීමට ඔහු අදහස් කරයි.

I. මෙවැනි ස්වයංක්‍රීය පද්ධතියක් ඇතිකිරීමෙන් ඔහුට ලැබෙන වාසියක් හා අවාසියක් ලියන්න.

II. පද්ධති විශ්ලේශණ අවස්ථාවේදී කමල්ට කිරීමට සිදුවන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

III. ඔහුගේ ව්‍යාපාරයට සම්බන්ධ උප පද්ධතියක් හා බාහිර පද්ධතියක් නම් කරන්න.

IV. මෙම ව්‍යාපාරයට පරිගණක ආධාරක ස්වයංක්‍රීය තොරතුරු පද්ධතියක් අනුගත කිරීමේදී සැළකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

5

I. 1සිට 10 දක්වා අනුයාත සංඛ්‍යාවල වර්ගය මුද්‍රණය කිරීම සඳහා සුදුසු ගැලීම් සටහනක් අඳින්න.

II. ගැලීම් සටහනේ දක්වා ඇති තර්කයට අදාළ ව්‍යාජ කේතය ලියන්න.

III. ඉහත අනුයාත සංඛ්‍යාවන්හි, වර්ගමූලය සෙවීම සඳහා ඉහත ගැලීම් සටහන විකරණය(modify) කළයුත්තේ කෙසේද?

6 පහත දැක්වෙන ඒවායින් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. පරිගණක වයිරස

II. රාජ්‍ය ආයතන පරිගණක ගත කිරීමේ වැදගත්කම

III. තොරතුරු සංනිවේදන තාක්ෂණ මගින් ජාතීන් අතර සුහදතාවය වර්ධනය කිරීම

IV. මාර්ග ගත සාප්පු සවාරිය (Online Shopping)